කඩුගන්නාව නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කඩුගන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රු.67,500 ක දැන්වීම් පුවරු ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | 2019 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | ණයහිමියෝ රු.1,152,033 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | පුස්තකාල පොත් ශේෂය රු.258,139 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට සමීක්ෂණයෙන් ඉවත් කළ රු.175,000 ක් වටිනා කොම්පෝස්ට් බැරල් 10 ක් හා වියදමට කපාහල යුතු රු.17,737 ක් වටිනා වැසිකිලි කට්ටලයක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවූ රු.827,599 ක ලැබිය යුතු ශේෂයක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ජංගම සේවා පවත්වා, නඩු පවරා නීතිමය කටයුතු කර, අදාළ ආයතන දැනුවත් කර අයකර ගන්නා බව වාර්තා කරමි. |
| (ii) | වර්ෂ 3 කට වැඩි රු.1,181,166 ක ගෙවිය යුතු ශේෂයක් ද නිරවුල් කිරීම කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමහර ශේෂ ගෙවා ඇත. සභාවේ මූල්‍ය තත්ත්වය මත කොටස් වශයෙන් ගෙවනු ලැබේ. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | රු.774,531 ක තැන්පත් ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තැන්පත් ලේඛන පරීක්ෂා කර බලා ඉදිරියේදී අදාළ වටිනාකම් ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ආ | 2014 දෙසැම්බර් 15 දිනැති අංක 1892 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | දැන්වීම් පුවරු 11 කින් රු.553,000 ක මුදලක් අයකර නොතිබුණි. | වර්ෂය මුල විධිමත්ව සමීක්ෂණය කර ගාස්තු අය කළ යුතුවේ. | දැන්වීම් පුවරු කිපයකින් ගාස්තු ගෙවා ඇති අතර, සමහර පුවරු කපා ඉවත් කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,175,888 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,871,783 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,650,000 | 7,655,135 | 8,171,375 | 5,357,337 | 7,500,000 | 7,635,212 | 7,349,477 | 5,873,578 |
| (ii) | කුලී | 3,032,300 | 2,114,985 | 1,952,635 | 674,918 | 3,309,000 | 4,175,392 | 3,927,442 | 765,395 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,300,000 | 1,314,386 | 1,314,386 | - | 1,150,000 | 1,426,954 | 1,399,954 | 27,000 |
| (iv) | වෙනත් ආදායම් | 2,585,000 | 2,798,655 | 2,232,409 | 1,015,961 | 2,826,000 | 911,428 | 1,914,595 | 736,238 |
| | | 14,567,300 | 13,883,161 | 13,670,805 | 7,048,216 | 14,785,000 | 14,148,986 | 14,591,468 | 7,402,211 |

2.2.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.21,285,372 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.13,670,805 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 64 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | පිළිගනිමි. |

2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟ ශේෂය රු.5,357,337 ක් වූ අතර, ඒ තුළ රජයේ ආයතන 10 කින් රු.937,152 ක ශේෂයක් අයවිය යුතුව තිබුණි. | හිඟ ආදායම් අය කර ගත යුතුවේ. | හිඟ වරිපනම් අය කිරීම වර්ධනය කරගෙන ඇති බව දන්වමි. |

2.2.4 කඩ කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කඩ 21 ක දීර්ඝකාලීනව පැවත එන රු.573,918 ක හිඟ ශේෂයක් විය. | හිඟ කඩ කුලී අයකර ගැනීමට | පිළිගනිමි. |

| | | |
|---|---|---|
| | කටයුතු කළ යුතුවේ. | |
| (ආ) 2008 වර්ෂයේ සිට පැවත එන රු.252,826 ක සතිපොළ ආදායමක් අයකර ගත යුතුව පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ වෙනුවෙන් රු.211,332 ක හා මුද්දර ගාස්තු රු.6,739,600 ක මුදලක් අයවිය යුතුව තිබුණි. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් කාරණා 14 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීම කළ යුතුවේ. | පිළිගනිමි. |

(ආ) අතහැරදැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංවර්ධන සැලැස්ම අනුව ඉටු කිරීමට ප්‍රතිපාදනය වූ රු.14,600,000 ක් වටිනා කර්මාන්ත 25 ක් ඉටුකර නොතිබුණි. | සංවර්ධන සැලැස්ම ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. | හදිසි ආපදා අත්‍යවශ්‍ය නඩත්තු කිරීම සඳහා යෝජනා ලැබුණු විට ඒවා අනිවාර්යයෙන්ම |

| | | |
|---|---|---|
| | | ක්‍රියාත්මක කළ යුතු වේ. එවිට මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොමැත. |

(ඇ) පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නොදිරන කසළ සභාවට අයත් භූමියක පරිසරයට හානිවන අයුරින් බැහැර කර තිබුණි. | පරිසරයට හා මහජනයාට හානි නොවන ලෙස කසළ බැහැර කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 12 දරන කඩ කාමරය 2011 වර්ෂයේ සිට ටෙන්ඩර් කර ලබා නොදීම හේතුවෙන් රු.1,290,000 ක ආදායමක් අහිමි වී තිබුණි. සභාවේ පොදු වැසිකිළි 2 ක් රු.825,000 කට ටෙන්ඩර් කර තිබුණ ද, බදු දීමට නොහැකි වී තිබුණි. | සභාව සතු කඩ කාමර විධිමත්ව තක්සේරු කර ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 04 ක පුරප්පාඩු 9 ක් පැවතුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2012 වර්ෂයේදී වරිපනම් තක්සේරු කළ පසු නැවත තක්සේරු කර නොතිබුණි. | වර්ෂ 5 කට වරක් වරිපනම් තක්සේරු කර බදු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇතත්, තක්සේරුව සිදුකර නොමැත. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ඉඩම්වල මායිම් හඳුනාගෙන ආරක්ෂා කිරීමට කටයුතු නොකිරීමෙන් අනවසර අල්ලා ගැනීම් හා පදිංචි වීම සඳහා ඉඩ සැලසී තිබුණි. | සභාව සතු ඉඩම්වල ආරක්ෂාවට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

3.5.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.1,400,000 ක වටිනා මෝටර් රථය හා රු.7,967,144 ක් වටිනා වයිබ්‍රේටින් රෝල භාවිතයෙන් තොරව ගාල්කර තිබුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම හෝ අපහරණය සඳහා කටයුතු කළ යුතුවේ. | සභාවට අයත් අංක 302 – 1522 දරන මෝටර් රථය වෙන්දේසි කිරීමට කටයුතු කරමින් පවතින අතර වයිබ්‍රේටින් රෝල අවශ්‍ය අවස්ථාවලදී පමණක් භාවිතා කරන බව කාරුණිකව දන්වමි. |